# සමාජීයවිද්‍යා පර්යේෂණ ක්‍රමයක් වන සන්ධාර විශ්ලේෂණය පිළිබඳ හැදින්වීමක්

*වරදිවෙල විජයසුමන හිමි* [1]

***ABSTRACT***

***Content Analysis is a research methodology, which is applied in the fields of Psychology, Anthropology, Sociology, Psychiatrics, History, Literature, Political Science, Education, Linguistics, especially in the field of Communication. According to the definitions given by various scholars, the Content Analysis Method is mostly used in the field of communication. This method is usually similar to the Document Study and it helps to analyze the scientific samples and quantitative data application, which can be analyzed through computers and statistics. The objective of this method is to examine all the specific field studies covered by various survey strategies. The Content Analysis Method was first used to analyze the news published in the newspapers. However, later it was developed into a research method, which is applied in the sociological researches as well. At present, the Content Analysis Method is predominantly used in the fields, related to newspapers, journals, magazines etc.***

[1] **Dr. Ven Wardiwela wijayasumana Thero, Senior Lecturer, B.Ed (Sp) Hons (COL), M.Phil (COL), PhD(PDN), Dean, Faculty of Language and Cultural Studies, Sri Lanka Bhikshu University. Anuradhapura. E-mail:wwsumana@gmail.com**

### හැඳින්වීම (Introduction)

සන්ධාර විශ්ලේෂණය යනු මනෝ විද්‍යා, මානව විද්‍යා, සමාජ විද්‍යා, මනෝ චිකිත්සා, ඉතිහාසය, සාහිත්‍යය, දේශපාලන විද්‍යා, අධ්‍යාපනය, වාග් විද්‍යා ආදි විෂය ක්ෂේත්‍රයන්හිත් විශේෂයෙන් සන්නිවේදන ක්ෂේත්‍රයෙහිත් භාවිතයට ගැනෙන පර්යේෂණ ක්‍රමයකි. මෙම පර්යේෂණ ක්‍රමය සන්දර්භ විශ්ලේෂණය හෝ අන්තර්ගත විශ්ලේෂණය නමින් ද හැඳින්වේ.

### සන්ධාර විශ්ලේෂණ පිළිබඳ නිර්වචන

* සන්ධාර විශ්ලේෂණය යනු සන්නිවේදනයේ පැහැදිලි ව සඳහන් සන්ධාරය වාස්තවික ව ද, ක්‍රමානුකූල ව ද, ප්‍රමාණාත්මක ව ද විස්තර කිරීමට යොදාගෙන ඇති ශිල්පීය ක්‍රමයකි. (බෙරිල්සන්, 1952 : 18)

* ලිඛිත හෝ වාචික වාර්තාවක අන්තර්ගතය ක්‍රමානුකූල ව විස්තර කරන ශිල්පීය ක්‍රමයකි. (සෝමර් හා සෝමර්, 1980 : 112)

* ඕනෑම සන්නිවේදනයක් වාස්තවික ව ද, ක්‍රමානුකූල ව ද, ප්‍රමාණාත්මක ව ද විස්තර කිරීම සඳහා සන්ධාර විශ්ලේෂණය හා කේත කිරීම යන පද එකිනෙකට හුවමාරු කළ හැකි පද වශයෙන් භාවිත කළ හැකිය. (කාර්ල් රයිට්, 1953 : 424)

* හුවමාරු කරගන්නා සන්නිවේදනයේ ලැබෙන සාධක අනුව හේතුන් හා ලබා ගන්නා නිගමන අධ්‍යයනය කිරීම සන්ධාර විශ්ලේෂණය යි. (ඔස්ගුඩ්, 1959 : 36)

* සන්නිවේදන පණිවිඩ ක්‍රමානුකූලවත්, වාස්තවිකවත්, ප්‍රමාණාත්මකවත්, විවිධ විචල්‍යයන් මැනීමට අධ්‍යයනය කිරීමට හා විශ්ලේෂණය කිරීමටත්, යොදාගත හැකි විද්‍යාත්මක උපකරණයකි. (කර්ලින්ගර්, 1964 : 544)

* සන්නිවේදන පණිවිඩයන්ගේ විද්‍යාත්මක විශ්ලේෂණය යන අදහසින් සන්ධාර විශ්ලේෂණය යන්න භාවිත වේ. මෙම ක්‍රමය පුළුල්ව කථා කරන විට විද්‍යාත්මක ක්‍රමයකි. එසේ ම එහි ස්වභාවයෙන් බොහෝ දේ ඇතුළත් වේ. (බාකස්, 1958 : 8)

මෙම නිර්වචන ආශ්‍රයෙන් ප්‍රකට වන්නේ සන්ධාර විශ්ලේෂණය බෙහෙවින් භාවිත වන්නේ සන්නිවේදන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් බවයි. මෙම පර්යේෂණ ක්‍රමය පිළිබඳ පුළුල් අධ්‍යයනයක නිරත වූ හෝල්ස්ටි එහි

අවශ්‍යතාව හා වැදගත්කම අවධාරණය කරයි. මෙම ක්‍රමය කිසියම් පණිවිඩයක විශිෂ්ට ලක්‍ෂණ ක්‍රමානුකූලව හා වාස්තවික ව හැඳිනගැනීමට හා නිගමනවලට එළඹීමට ඇති ශිල්ප ක්‍රමයක් බව ඔහු පැහැදිලි කරයි. (1969 : 14) මෙහි දී හෝල්ස්ටි මූලික අවධානයක් යොමු කර ඇත්තේ සන්නිවේදනයේ විශිෂ්ට ලක්‍ෂණ හැඳිනගැනීමේ දී වාස්තවික බව හා ක්‍රමානුකූල බව කෙරෙහි පමණි. පෙර දැක්වූ නිර්වචනවල සඳහන් ප්‍රමාණාත්මක බව මෙහි සඳහන් නො වේ.

කෙසේ වෙතත් සන්ධාර විශ්ලේෂණයේ මූලික කාර්ය වන්නේ වාචික, ගුණාත්මක වාර්තා ගෙන ඒවා ප්‍රමාණාත්මක දත්ත බවට පත් කිරීම බව බේලි (1994) සඳහන් කරයි.

සන්ධාර විශ්ලේෂණයේ ප්‍රතිඵල සාමාන්‍යයෙන් සංඛ්‍යාත හෝ ප්‍රතිශත ඇතුළත් වගු ලෙස දැක්විය හැකිය. මෙම පුද්ගල සහගත ක්‍රම වේදය මගින් වචන ගණන් කිරීම මගින් ඒවා සංඛ්‍යා බවට පත් කෙරේ.

පෙළෙහි අන්තර්ගත සුවිශේෂී ගුණාංග ක්‍රමානුකූල ව හා වාස්තවික ව හැඳිනගැනීම මගින් කරුණු අධ්‍යයනය කිරීමේ පර්යේෂණ ක්‍රමයක් ලෙස ස්ටෝන් (1966:05) කරනු ලබන විවරණය සන්ධාර විශ්ලේෂණයේ කාර්යභාරය කුමක්දැයි අපට පැහැදිලි කරදෙයි.

මේ අදහස හා සමාන අදහසක් ඉදිරිපත් කරන වෙබර් (1985:09) පෙළ, වගන්තිය, ප්‍රකාශය පිළිබඳ වලංගු නිගමනයක් ඇති කරගැනීමට අදාළ ක්‍රියා පද්ධතියක් උපයෝගී කරගැනීමට භාවිත කරන පර්යේෂණ ක්‍රමයක් ලෙස හඳුන්වා දෙයි. මේ ගැන වැඩි දුරටත් කරුණු දක්වන වෙබර් නිගමනය, පණිවිඩය යවන්නා, පණිවිඩය ලබන්නා පිළිබඳ ව වූවක් බව ද කියයි.

### *සන්ධාර විශ්ලේෂණයේ අරමුණු*

සන්ධාර විශ්ලේෂණය සමාන්‍යයෙන් වාර්තා අධ්‍යයනය (Document Study) හා සමාන වේ. පරිගණක මගින් හා සංඛ්‍යාන විද්‍යාත්මක ඉගැන්වීම් මගින් විශ්ලේෂණය කළ හැකි විධිමත් උපන්‍යාස භාවිතය හා විශාල වශයෙන් විද්‍යාත්මක නියැදි හා ප්‍රමාණාත්මක දත්ත භාවිතය සඳහා සන්ධාර විශ්ලේෂණය උපකාරී වේ.

මෙම ක්‍රම ශිල්පයේ අරමුණ වන්නේ විවිධ සමීක්‍ෂණ උපක්‍රම මගින් ආවරණය කරනු ලබන සුවිශේෂී සියලු ක්ෂේත්‍ර අධ්‍යයනයට ලක් කිරීමයි. ඊට අතිරේක ව එම ක්‍රමයට ම විශේෂිත අරමුණු සමහරක් ද වේ. එනම් කර්තෘත්වය පිළිබඳ ප්‍රශ්න කිරීමට ලක් ව ඇති වාර්තාවන්හි කර්තෘත්වය තීරණය කිරීම ඉන් එකකි.

විද්‍යාත්මක උපන්‍යාසය පරීක්‍ෂා කිරීම හැරුණු විට සන්ධාර විශ්ලේෂණයේ අරමුණු හතක් හෝල්ස්ටි (1969 : 43) දක්වයි.

01. සන්නිවේදන අන්තර්ගතයේ ප්‍රවණතා විස්තර කිරීම.
02. ඉදිරිපත් කරනු ලබන පණිවිඩය හා හැඳිනගත් ගුණාංග පිළිබඳ මූලාශ්‍ර ප්‍රකාශ කිරීම.
03. ප්‍රමිතීන්ට එරෙහි සන්නිවේදනයේ අන්තර්ගතය ගණනය කිරීම.
04. ඒත්තු ගැන්වීමේ ක්‍රම විශ්ලේෂණය කිරීම.
05. ශෛලිය විශ්ලේෂණය කිරීම.
06. ප්‍රේක්ෂකයන් සඳහා නිෂ්පාදිත පණිවිඩවලට ඔවුන්ගේ දන්නා ගුණාංග ප්‍රකාශ කිරීම.
07. සන්නිවේදන රටා විස්තර කිරීම යනු ඒ හතයි.

මේ පිළිබඳ ව අධ්‍යයනය කිරීමේදී Sciencetific Method & Social Research නම් ග්‍රන්ථය ලියූ සෝෂ් (1982) දක්වන අදහස් මෙසේ පෙළ ගැස්විය හැකිය.

01. සන්නිවේදනයේ අරමුණු හැඳිනගැනීම.
02. ප්‍රචාරයේ පැවැත්ම අනාවරණය කරගැනීම.
03. දේශපාලන බුද්ධිය ලබා ගැනීම.
04. මනෝවිද්‍යාත්මක ආකල්ප හැඳිනගැනීම.
05. ඇගයීමක්, ක්‍රමයක් හෝ ආකල්පයක් පැතිරවීම හෝ විනාශ කිරීම.
06. සන්නිවේදනයන්ගේ ආකල්පමය හෝ චර්යාත්මක ප්‍රතිචාර විස්තර කිරීම.
07. සන්නිවේදනයේ ප්‍රවණතා විස්තර කිරීම.
08. අදහස්වල හෝ න්‍යායන්ගේ හෝ ආනුභාවික සාධකයන්ගේ සංවර්ධනය අනාවරණය කරගැනීම.
09. වෙනත් සන්නිවේදන ක්‍රම පද්ධති හෝ කාරක සංසන්දනය කිරීම.
10. සන්නිවේදන ක්‍රමයන්හි ජාත්‍යන්තර විවිධතා අනාවරණය කිරීම.
11. සන්නිවේදන ප්‍රමිතීන් නිර්මාණය කිරීම හා අදාළ කරගැනීම.
12. පවත්නා ප්‍රවණතා හා අංග සොයා ගැනීම.
13. ප්‍රචාරක ක්‍රමය අනාවරණය කිරීම.
14. පර්යේෂණයට උදව් වීම යනුවෙනි.

මේ අනුව වාර්තා කරන ලද සංසිද්ධීන් විද්‍යාත්මක ක්‍රමයට අනුව සැලකිය හැකි දත්ත බවට පත් කිරීම මඟින් දැනුම පිළිබඳ ක්‍රමයක් ගොඩනැගීම යි.

### *සන්ධාර විශ්ලේෂණ ක්‍රමයේ විකාශනය*

පර්යේෂණ ක්‍රම ශිල්පයක් ලෙස මෙය භාවිතයට පැමිණ ඇත්තේ 20 වැනි ශතවර්ෂය මුල් කාලයේ දී පමණ බව පැහැදිලි ය. පර්යේෂණ ක්‍රම ශිල්පයක් ලෙස 1940 සිට වරින් වර මෙය භාවිත වූ බව පෙනේ. හෝල්ස්ටි (1969:30) ට අනුව 20 වැනි ශතවර්ෂයේ මුල් දශක දෙකේ දී කරන ලද

පර්යේෂණ අතරින් 2.5% ක් පමණ පර්යේෂණ සඳහා මෙම ක්‍රමය භාවිතයට ගත් බව සඳහන් වේ. ඊළඟ දශක තුන තුළ දී මෙම පර්යේෂණ ක්‍රමවේදය යොදා ගනු ලැබූ සාමාන්‍යය පිළිවෙලින් 13.3, 22.8, 43.3 දක්වා ඉහළ ගිය බව ඔහු පෙන්වා දෙයි. මේ අනුව 1930-1959 අතර කාල වකවානුව තුළ සන්ධාර විශ්ලේෂණය ක්‍රමවේදය භාවිත කොට කළ පර්යේෂණ සංඛ්‍යාව වර්ධනය වීමට ප්‍රධාන හේතුව වන්නේ පර්යේෂකයන් රාශියක් මෙම ක්‍රමය භාවිතයට ගත් නිසා බව පැහැදිලි ය. එසේ මෙම ක්‍රමය සිය පර්යේෂණ ක්‍රම ශිල්පය ලෙසින් භාවිත කළ අය අතර ඒබ්‍රහම් කප්ලාන් (1943), රැල්ෆ් වයිට් (1947), හැරල්ඩ් ලාස්වෙල් (1950), ඩැනියෙල් ලර්නල් (1950), ඉකියල් ප්‍රල් (1951), බර්නාඩ් බෙරිල්සන් (1952) ප්‍රධාන වෙති. මේ අනුව මෙම භාවිතය නිසා 1950-58 කාලය තුළ සන්ධාර විශ්ලේෂණය ක්‍රමවේදය අනුව සිදු කළ අධ්‍යයන සංඛ්‍යාව වර්ධනය වී ඇති බව පෙනේ.

සන්ධාර විශ්ලේෂණය මුල දී භාවිත කොට ඇත්තේ පුවත්පත්හි පළවන ප්‍රවෘත්ති විග්‍රහ කිරීමට ය. උදාහරණයක් ලෙස කුමන ක්ෂේත්‍රයක් පිළිබඳ ව ප්‍රවෘත්ති කොපමණ සංඛ්‍යාවක් ඉදිරිපත් කර ඇත්දැයි පැවසීම වැනි අරමුණු ඒ අතර තිබූ බව පෙනේ. (ට්‍රැවර්ස්, 1961:316) එසේම ගුවන් විදුලි ප්‍රචාර, සිරකරුවන් පිළිබඳ තොරතුරු හමුදාවන් සම්බන්ධ තොරතුරු ආදිය පිළිබඳවත් මේ ක්‍රමය යටතේ විග්‍රහයට ලක් කර තිබේ.

මේ අනුව පසු කාලය වන විට සමාජීය විද්‍යා පර්යේෂණවල භාවිතයට ගැනෙන පර්යේෂණ ක්‍රමයක් ලෙස ද, එම ක්ෂේත්‍රයේ ම භාවිතය පුළුල් වූ බව පෙනේ.

### *සන්ධාර විශ්ලේෂණයේ භාවිතය*

සන්ධාර විශ්ලේෂණය ක්‍රම ශිල්පය යොදා ගනිමින් පුවත් පත් පිළිබඳ ව ඉතා සියුම් පර්යේෂණයක් කරන ලද අය අතර ලාස්වෙල් හා ඔහුගේ සහායකයන් වැදගත් වේ. ඔහු මෙහි දී සංකේත විශ්ලේෂණය සංවර්ධනය කළේය. මේ අනුව සමහර සංකේත එනම් ප්‍රජාතන්ත්‍රවාදය, සමාජවාදය යනාදිය අධ්‍යයනයට ලක් කළේ ය. ඔර්ලික්හි පළවූ පුවත්පත් පිළිබඳව ඩේවිඩ්සන්ගේ විශ්ලේෂණය රටවල්වල නම් හා තේමා ඔස්සේ පදනම් විය. ඔහු තේමාත්මක විශ්ලේෂණය දියුණු කළේය. රයිට් හා නෙල්සන් විසින් ජපානය හා චීනය සම්බන්ධ පුවත්පත්වල නියෝජනාත්මක අධ්‍යයනයක් සිදු කරන ලදී.

සන්ධාර විශ්ලේෂණය යොදා ගනිමින් පුද්ගලයන්ගේ ආකල්ප අධ්‍යයනයට හෝ ජාතික අගතිය, තහනම් කිරීම්, ජාත්‍යන්තර සබඳතා, සංවර්ධන ප්‍රතිපත්ති යනාදී සමහරක් වැදගත් දෑ පිළිබඳව පුවත්පත්හි අන්තර්ගතය විශ්ලේෂණය කිරීමට පුළුවනි.

සන්ධාර විශ්ලේෂණයේ පරම පරමාර්ථය වන්නේ, ප්‍රමාණාත්මක දත්ත මගින් උපන්‍යාස පරීක්ෂා කිරීමට උපකාරී වීම යි. විනිශ්චයක් හෝ හැඟීම්

වෙනුවට නිශ්චිත හා වාස්තවික පිළිතුරු සැපයීමට මෙම ක්‍රමය භාවිත කළ හැකි ය. මෙම විශ්ලේෂණය වාස්තවික හා ක්‍රමානුකූල වන අතර, වඩාත් විශ්වසනීය ප්‍රතිඵල ලබා ගැනීමට ද යොමු කරයි.

නූතනයේදී සන්ධාර විශ්ලේෂණයේ අරමුණු සඳහා සන්නිවේදනයේ අන්තර්ගතය උරාගැනීමට නව ප්‍රතිමාන එකතු කරයි. අමුද්‍රව්‍යයක් ප්‍රමාණාත්මක කිරීම සඳහා හා මැනවින් දක්වා ක්ෂේතගත කිරීමට උදව්වන හා සුදුසු උපක්‍රමයක් ලෙස එහි අරමුණු වර්ධනය වී තිබේ. එමෙන් ම දත්ත විශ්ලේෂණයට හා සංවිධානයට ද මෙම විශ්ලේෂණ ක්‍රමය මහත් සේ උපකාරී වේ.

## *සන්ධාර විශ්ලේෂණයේ දී භාවිතයට ගැනෙන උපක්‍රම*

මෙම පර්යේෂණ ක්‍රමයේ දී පර්යේෂකයන් විසින් මානව සන්නිවේදනයේ සියලු අංග ආවරණය කෙරේ. එනම් ලිපි, කථා, කවි, රචනා, දිනපොත්, මරණ දැන්වීම්, වාර්තා, ජීවන චරිත කථා, ප්‍රවෘත්ති, ගුවන් විදුලිය, රූපවාහිනිය, සාකච්ඡා, කාටූන්, චිත්‍ර, ඡායාරූප, සිනමා ආදිය අධ්‍යයනයට ලක් වේ.

මෙම අධ්‍යයනයන්හි දී සන්ධාර විශ්ලේෂණය සිදු කරන අයුරු විමසීම වැදගත්ය.ප්‍රථමයෙන් හා මූලික වශයෙන් කළ යුතු වැදගත් ම දෙය වන්නේ අධ්‍යයනය කිරීමට ඇති ක්ෂේත්‍රය හැඳිනගැනීමයි.

*උදා:-* යෞවන වයසේ ළමුන්ගේ පොත්වල ඇතුළත් වන ලිංගික භූමිකාව පිළිබඳ අධ්‍යයනයේ දී (ඇන්ඩර්සන් හා යිප් 1987) අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස ඔවුන් තෝරා ගන්නේ ඔස්ට්‍රේලියා භාෂා ඉගැන්වීම් වැඩ සටහනේ ප්‍රථම පොත් නවය හා Australion Basic Readers යන පොතේ ප්‍රථම පොත් නවයයි.

දෙවැනි පියවර වන්නේ තමන් තෝරා ගත් පර්යේෂණ ක්ෂේත්‍රය වර්ගවලට බෙදා ගැනීමයි. මෙය සන්ධාර විශ්ලේෂණයේ වැදගත් ම පියවර වේ. (කර්ලින්ගර්:1986) එසේ වැදගත් වනුයේ එමගින් පර්යේෂණයේ අරමුණු තීරණය වන නිසා හා එහි යටින් දිවෙන න්‍යාය හෙළිවන නිසාය. මෙහි දී ඒ ඒ වර්ග වාස්තවිකව නිර්වචනය කළ යුතු අතර ඒ වර්ග අතර අන්‍යොන්‍ය සබඳතාව පැවතිය යුතුය.

තෙවැනි පියවර වන්නේ වර්ගීකරණය නිශ්චිතව කළ පසු විශ්ලේෂණය කළ යුතු ඒකක තීරණය කිරීම යි.

බේලි (1994:306) දක්වන අන්දමට මෙම පර්යේෂණ ක්‍රමය භාවිතයට ගන්නා පර්යේෂකයා පහත සඳහන් කරුණුවලට විසඳුම් සපයා ගත යුතු වේ. එනම්,

01. පර්යේෂණයට ලක් කෙරෙන වාර්තාවන්ගේ නියැදියක් සකසා ගැනීම.

02. වර්ගයන්ගේ අන්තර්ගතය නිර්වචනය කිරීම (මෙය සැබවින්ම රඳාපවතින්නේ අධ්‍යයනයේ අරමුණු මත ය)
03. විශ්ලේෂණය කරනු ලබන ඒකක නිර්වචනය කිරීම.
04. අන්තර්ගත ඒකකය නිර්වචනය කිරීම.
05. ප්‍රමාණය කරන ක්‍රමය තීරණය කිරීම. යන කරුණු සඳහා විසඳුම් සපයා ගත යුතු ය.

හෝල්ස්ටි (1969:95) ට අනුව නිර්වචනය කරගනු ලබන වර්ග පර්යේෂණයේ අරමුණු පිළිබිඹු කරන්නක් විය යුතු ය. එසේ ම ඒවා අන්‍යොන්‍ය සාධාරණ හා ස්වාධීන විය යුතු ය. ස්වාධීනවීම යනු එක් වර්ගයක වටිනාකම හෝ අගය අනෙක් වර්ගයේ වටිනාකම හෝ අගය තීරණය කරන්නක් නොවිය යුතු ය. පර්යේෂකයා සිය අරමුණු තීරණය කළ පසු උචිත වර්ගීකරණ කුලකයන් ද තීරණය කළ යුතු වේ. අධ්‍යයනයට ලක්වන ලියකියවිලි වාර්තා පරීක්ෂා කිරීමෙන් හා ඒවායේ ඇතුළත් පොදු ලක්ෂණ සොයා බැලීමෙන් පසු ව සන්ධාර විශ්ලේෂණයේ දී වර්ගීකරණය සිදු කෙරේ. විශ්ලේෂණයට ලක් කෙරෙන ලියවිලි තුළින් ම වර්ගයන් මතුවීමට ඉඩ හැරීමෙන් අන්‍යොන්‍ය සාධාරණ හා සම්පූර්ණ ඉලක්ක හමු වේ. පර්යේෂණයට ලක් කෙරෙන ලියකියවිලිවල හෝ වාර්තා පිළිබඳ පූර්ව පරීක්ෂාවකින් තොරව වර්ගයන් ගොඩනැගීම මගින් වැදගත් වර්ග අත්හැරීමට ඉඩ ඇති අතර, අනවශ්‍ය දෑ ඇතුළත්වීමට ද ඉඩ ඇත. මේ සඳහා උදාහරණයක් ලෙස මොට් (1942) පුවත්පත්හි අන්තර්ගත ප්‍රවණතා හැඳිනගැනීම සඳහා වර්ගයන් බෙදා දැක් වූ අයුරු දැක්විය හැකිය. එහි දී මොට් බෙදා දැක් වූ වර්ග මෙසේය:

01. විදේශීය පුවත් හා විශේෂාංග,
02. වොෂින්ටන් ප්‍රවෘත්ති,
03. රාජ්‍ය කටයුතු පිළිබඳ තීරු ලිපි,
04. කර්තෘ වාක්‍යයන්,
05. ක්‍රීඩා,
06. සමාජය,
07. කාන්තා අභිරුචීන්,
08. සිනමාව, පොත්, චිත්‍ර,
09. ගුවන් විදුලි ප්‍රචාරයන් හා ප්‍රවෘත්ති,
10. චිත්‍ර කථා,
11. රූප චිත්‍ර ආදිය යනුවෙනි.

### *ඒකක හැඳිනගැනීම*

විශ්ලේෂණයට යොදා ගනු ලබන ඒකකය මෙහි දී ඒකක හෙවත් Recording Units යනුවෙන් හැඳින්වේ. හෝල්ස්ටි (1969, 116-119) සන්ධාර

විශ්ලේෂණයේ දී අධ්‍යයනයට ලක් කරනු ලබන ප්‍රධාන ඒකක පසක් හැඳිනගෙන ඇත.

01. තනි වචනය හෝ සංකේතය
02. තේමාව
03. චරිතය උදා : නවකථාවක, නාට්‍යයක, චිත්‍රපටියක හෝ ශ්‍රව්‍ය දෘෂ්‍ය වැඩ සටහනක ඇතුළත් චරිතයක්)
04. වාක්‍ය හෝ ඡේදය
05. අයිතමය

### තනි වචන

මෙම පර්යේෂණයන්හි දී යොදා ගනු ලබන කුඩා ම ඒකකය තනි වචනයයි. කිසියම් පර්යේෂකයකුගේ නියැදිය විශාල දීර්ඝ ලියවිල්ලක් නම්, එහි පර්යේෂකයාට පාලනය කිරීමට වචන සමූහයක් තිබේ නම් ඔහු තනි වචනයක් විශ්ලේෂණ ඒකකයක් ලෙස තෝරා ගැනීම කියා අනෙක් දත්ත විනාශ විය හැකි ය. මේ නිසා විශාල ඒකකයක් වෙනුවෙන් තනි වචනය අත්හැර දැමීම සමහර විට සිදු වේ. හෝල්ස්ට් (1969:116) අනුව කියවීමේ හැකියාව ශෛලිය, මනෝ චිකිත්සාව හා ශාස්ත්‍රීය අනාවරණයන් පිළිබඳ අධ්‍යාපනවල දී වචන හෝ සංකේත බහුල ව භාවිතා වී ඇත. වචනයක් හෝ සංකේතයක් විශ්ලේෂණ ඒකකයක් ලෙස භාවිතා කිරීමේ දී, සිදුවන වාසිය වන්නේ තනි වචනය එකිනෙකට වෙනස්වීමයි. එහි පැහැදිලි සීමා ඇති අතර සාපේක්ෂ වශයෙන් හැඳිනගැනීම පහසුය.

### තේමාව

තේමාව යන්නෙන් වාර්තාවල යහපත, අයහපත පිළිබඳ අරමුණු හෝ එම වාර්තාවල ඉලක්ක හෝ ලේඛනයේ කොටසක් යන අදහස ගෙන දෙයි. එවැනි එක් තේමාවක් ලෙස රුසියාව, චීනය හා කොමියුනිස්ට් ධර්මය ඇමරිකන් ජනතාවගේ ජීවිතයට හා විමුක්තියට සමානය හෝ තර්ජනයක් වේය යන්න ගත හැකිය. තවත් තේමාවක් වන්නේ - ශූන්‍ය ජනගහණ වර්ධනයක් රහිත ව ලෝකය සාමාන්‍යයෙන් විනාශයට පත්වනු ඇත යන්න යි.

තේමාව පිළිබඳ පූර්ණ පැහැදිලි කිරීමක් සඳහා වචන කිහිපයක් හෝ වාක්‍යයක කොටසක් හෝ ඡේද කිහිපයක් හෝ පරිච්ඡේද හෝ වෙළුම් ගණනාවක් අවශ්‍ය විය හැකිය. තේමාවේ සීමා නිශ්චය කිරීමේ දී එය වෙනත් ඒකකයක් වන වචනය පිළිබඳ සීමා නිශ්චය කිරීමට වඩා අසීරු හා පුද්ගල බද්ධ විය හැකිය. ලේඛනයක උප කොටසක් ව්‍යාකරණ නීති හා ලේඛන ශෛලිය මගින් සීමා කරනු ලැබේ. එහෙත් තේමාව එවැනි නිශ්චිත සීමා

For Library Use Only

නොමැත. තේමාව ආරම්භ වන්නේ කොතැන ද?අවසාන වන්නේ කොතැන ද? යන්න පිළිබඳ ව සවිඥානක බව අඩුවිය හැකි ය.

LIBRARY RAJARATA UNIVERSITY OF SRI LANKA MIHINTALE PERIODICAL SECTION

*චරිතය*

වාර්තා ඒකකයක් ලෙස චරිතය ගතහොත් ලියවිල්ලට එනම් කටකථා, කාව්‍ය, ටෙලි නාට්‍ය, තිර පිටපත් හෝ වෙනත් ලියවිල්ලක ඇතුළත් චරිතයක් මෙහි දී සැළකේ. චරිත කෙරෙහි වර්ගීකරණය යොදවන්නේ සාමාන්‍යයෙන් ඒවා ඇතුළත් වන සමාජ ආර්ථික තත්ත්වය ආදිය කෙරෙහි ය. මෙවැනි ඒකකයක් වාසිය වන්නේ නොබෙදුණු හෝ පැහැදිලි පුද්ගලයෙක් පිළිබඳ ව තේමා කේතකරණයේ දී සීමාවන් පිළිබඳ ප්‍රශ්නය මග හැරීම යි. තවදුරටත් පර්යේෂකයන් චරිතය ඒකකයක් ලෙස යොදන කල්හි සංඛ්‍යාවන් සමග සම්පූර්ණයෙන් ම යටපත් කර යොදනු නො ලැබේ. මේ අනුව චරිතය යන්න සුදුසු හා ආදේශ කළ හැකි හෝ ඒකකයකි. නමුත් සීමිත උපයෝගීතාවන් ඇති අතර විශේෂිත වර්ගයේ ලියවිලි සමග පමණක් යෙදිය හැකි ය.

*වාක්‍ය හෝ ඡේද*

වාක්‍ය හා ඡේද ඇතුළත් ව්‍යාකරණ ඒකකයන්හි සීමාවන් පහසුවෙන් හැඳිනගත හැකි ය. වචන ඒකකය මෙන් නොව වාක්‍ය හා ඡේද ඒකකයේ නිශ්චිත අවාසිය වන්නේ එහි නිතර ම එක මාතෘකාවකට හෝ තේමාවකට වඩා ඇතුළත්වීමයි. මෙසේ ඒවා පොදු නොවූ වඩාත් සතුටුදායක වාර්තා ඒකක නොවේ.

*අයිතමය*

ලේඛන වැඩි ප්‍රමාණයක් සැසඳිය යුතු අවස්ථාවල දී අයිතමය විශ්ලේෂණ ඒකකයක් ලෙස හෝල්ස්ටි නිර්දේශ කරයි. සම්පූර්ණ ලිපියක්, චිත්‍රපටියක් හෝ ගුවන් විදුලි වැඩ සටහනක් ලෙස විදහා දක්වන කල අයිතමය වාර්තා ඒකකයක් ලෙස ගැනේ. මෙම ඒකකය බොහෝ පර්යේෂණවල දී දළ ඒකක ලෙස සැළකේ.

*සන්දර්භ විශ්ලේෂණය සිදු කරන ආකාරය*

මෙම පර්යේෂණ ක්‍රමයේ දී ද කිසියම් සංසිද්ධියක් පර්යේෂණාත්මක ව විශ්ලේෂණය කිරීම සිදු වේ. පර්යේෂණය බහුල ව සිදු වනුයේ සන්නිවේදන ක්ෂේත්‍රය ආශ්‍රිතව යි. එහි දී ප්‍රවෘත්ති සඟරා හෝ පත්‍රිකා අදිය ආශ්‍රිත ව සිදු කෙරේ.

*උදා :* ටයිම්ස් සඟරාවේ පිටකවර භාවිතයෙන් 1950 දශකය හා 1960 දශකය විශ්ලේෂණය කරන ලදී. ඒ අනුව 1960 දශකයේ එම සඟරාවේ පිටකවරවල බහුල ව යෙදී තිබුණේ දේශපාලන මාතෘකාවන් ය. එහෙත් 1950

දශකයේ එසේ නොවිණි. මෙමගින් 1960 දශකයේ දේශපාලන උනන්දුව 1950 දශකයට වඩා වැඩි බව කියැවෙන සිද්ධාන්තයක් තහවුරු කළේය. (හෙට්ටිආරච්චි, 2002:99)

මෙම ක්‍රමය භාවිතයට ගන්නා විට වචන ගණන් කිරීම මගින් තේමාවක් අන්තර්ගත විශ්ලේෂණය සිදු කළ හැකිය. උදාහරණයක් ලෙස මාස කිහිපයක් පුවත්පත් කිහිපයක් ඇසුරින් දේශපාලන ප්‍රචණ්ඩත්වය හා අදාළ වචන භාවිත වී ඇති අයුරු අධ්‍යයනය කොට දේශපාලන ප්‍රචණ්ඩත්වය පිළිබඳ නිගමනයකට බැසගත හැකි ය.

වචන ගණනය කර සංකල්ප ගොඩනගාගැනීම ද මෙම පර්යේෂණ ක්‍රමය මගින් සිදු කළ හැකිය. උදාහරණයක් ලෙස අපරාධ, බාලාපරාධ, සොරකම් හා මංකොල්ලකෑම් යන වචන තුළින් අපගාමීත්වයක් අනාවරණය වේ. එම වචන ඒකරාශි කිරීමෙන් අපගාමී සංකල්පයක් ඇති බව විශ්ලේෂණය කළ හැකි ය. (හෙට්ටිආරච්චි 2002, 100)

## *ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය (References)*


Beril son, B. (1952).Content Analysis In Communication Research, Glencoe, New York: Free Press.

Best, J. W/Khan, J.V. (1992) Research In Education, New Delhi: Prentic Hall of India Pvt.

Care Wright, D.P. (1953) Analysis of Qualitative Material In L. Festinger & D. Kats Edition.

Frenkel, J.R., Wallen, N.E. (1993) How to Design and Evaluate Research in Education, Tokyo, and Toronto: Mac grow Hill, Inc.

Ghosh, B.N. (1982) Scientific Methods and Social Research, New Delhi: Sterling Publishers (pvt.) Ltd.

හෙට්ටිආරච්චිල, ශිරානි - (2000)සමාජ විද්‍යා පර්යේෂ ක්‍රම,

Holsty, O.R.(1969) Content Analysis, Addition & Wesley Publishing Co.

Keeres, J.P. Educational Research Methodology & Measurement, An International Hand Book

Kenneth D. Bailey,(1994) methods of Social Research, The Free Press, New York,

Kirlinger, F.N. (1964) Foundation of Behavioral Research,
Travers, Robert, (1961) An Introduction to Education Research, New York: The Macmillan Co.